# කුෂාලටත් බබතිණිකි



නදනි ශ්‍රීධාරා ජයසිංහ

# කුඩාළුටත් බෙඩගීය

නදනි ශ්‍රීධාරා ජයසිංහ

එයාලටත් බඩගිනියි

© නදනි ශ්‍රීධාරා ජයසිංහ

හිමිකම කතෘ සතුයි.

ඇතුලත චිත්‍ර-නදනි ශ්‍රී ධාරා ජයසිංහ

ප්‍රකාශිත දිනය 2025.02.08

ISBN 978-624-208-261-5

<u>පිදුම</u>

මගේ විදුහල් මවුන්ටත්,
මෙවන් පොතක්..
මෙසේ අකුරු කරන්නට,
මා ගොඩනැගූ,
සියලුම ගුරු මාපිය වරුන්ටත්..
ආදරයෙන්,
ගෞරවයෙන්,
පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# කුරුලටත් බඩගිනියි

ලස්සන ගමක එක ගෙදරක මලිති කියල පුංචි ගෑනු ළමයෙක් හිටියා.එයාගෙ ගෙදර හිටියෙ අම්මයි, තාත්තයි, අත්තයි, අත්තම්මයි මලිතිගෙ අක්කයි.මලිති සත්තුන්ට හරිම ආදරෙයි.එයාගෙ ගෙදර පිටිපස්සෙ තියෙන ලස්සන කැලෑවෙ ගලක් උඩ ඉඳගෙන කුරුළු සද්ද අහ අහ පොත් කියවන්න මලිති හරිම ආසයි.



මලිතිගෙ අත්තයි අත්තම්මයි එයාලගෙ ගෙදර වත්තෙ එළවළු,පළතුරු වගේම ගෙදරට ඕන හැමදේම වගා කරල තිබුනා.ගේ පිටිපස්සෙ සම්පූර්ණයෙන් තිබුනෙ බතල,මඤ්ඤොක්කා, කිරි අල වගේ අල වර්ග.

එක දවසක් උදේ අත්තම්ම ගේ පිටිපස්සේ ඉඳං මහ හයියෙං බෙරිහං දෙනව මලිතිලට ඇහුන.දුවගෙන ගිහිං බලනකොට ගේ පිටිපස්සෙ තිබුන බතල පාත්තියි මඤ්ඤොක්කා පඳුරු කීපෙකුයි උදුරල දාල තිබුන.දූකටයි කේන්තියටයි අත්තම්මගෙ මූණ රතු වෙලා.
" මම නං ආය කිසි දෙයක් වවන්නෙ නෑ",අත්තම්ම කේන්තියෙං කිව්වා.
කියලා තැනිං තැන ඉතුරු වෙලා තිබුණු බතල අල කීපෙකුයි,මඤ්ඤොක්කා අල ටිකකුයි ගලවගෙන ගෙට ගියා.
එදත් හවස මලිති කතා පොතකුත් අරං ගේ පිටිපස්සෙ කැලේ එයා ආස කරපු ගලට ගියා.හොඳට හරි බරි ගැහිල වාඩි වෙලා පොත පෙරලගත්තා.ටික වෙලාවකින් මලිතිට නින්ද ගියා.



එයාට ඇහැරෙනකොට හොඳටම රෑ වෙලා.වටේම කරුවල වෙලා.හරිම කරුවලයි.කණාමැදිරි එළි විතරයි පෙනුනේ.බල්ලො උඩුබුරන සද්ද,රෑහැයියො කෑ ගහන සද්ද විතරයි ඇහුනෙ.මලිති හොඳටම බයවෙලා අඬන්න පටන් ගත්තා.ටිකක් වෙලා මෙහෙම ඉන්නකොට කවුරුහරි ඇවිදිනව වගේ කොළ පොඩිවෙන සද්දයක් ඇහෙන්න ගත්ත.මලිති කෑ ගහන්න හදනකොටම කවුරුහරි මලිතිගෙ අතිං අල්ලගත්ත.ඒත් එක්කම වළාකුලකිං වැහිල හිටපු හඳමාම පේන්න පටංගත්ත.මලිතිගෙ අතිං අල්ලන් හිටියෙ ඌරෙක්.



“ඔයා බය වෙන්න එපා.මම කැලෑවෙ ඇවිදිනකොට අහම්බෙං ඔයාව දැක්කෙ”.මෙන්න ඌර කතා කරනවා.මලිත්ට අදහගන්නත් බෑ. “ඔයාලට කතා කරන්න පුළුවන්ද?” මලිත් පුදුමයෙං ඇහුව.

“ඔව් , මට විතරක් නෙවෙයි,අපි ඌරෝ හැමෝටම කතා කරන්න පුළුවං.මේක අපෙ රහසක්. කිසි කෙනෙකුට කියන්න එපා” ඌරා මලිත්ගෙං ඉල්ලා හිටියා.මලිත්ත් ඒකට එකඟ උනා.

“ ඇයි ඔයා කැලෑවට ආවෙ? ” ඌරා ඇහුවා.

“ මම හැමදාම මේ ගලට එනව පොත් කියවන්න.අද දන්නෙම නැතුව නින්ද ගිහිං” මලිත් කිව්වා.

“ මේ රෑ ඔයාට පාර හොයාගන්න නම් අමාරු වෙයි.කමක් නෑ. ඔයා එන්න මාත් එක්ක” ඌරා මලිත්ට කිව්වා.

“ ඒ කොහෙද?”.මලිත් ඇහුවා.

“ අපෙ ගමට,මගෙ ගෙදරට” ඌරා කිව්වා.

“ ඔයාලට ගෙවල් තියෙනවද?” මලිත් පුදුම වෙලා ඇහුවා.

“ ඔව්.... යමුකෝ ...” ඌර ඉස්සර වෙමින් කිව්වා.



ඔන්න ටික දුරක් යනකොට ඇතිං පිදුරුවලිං හදල තිබුන ගේට්ටුවක් පෙනුනා.ඌරා ඒක තල්ලුකරගෙන ඇතුලට ගියා.එතන මහ කලබලයක්.

ඌරො ගොඩක් හිටියා.තැනිං තැන පුංචි ගෙවල් තිබුනා.ඌරො කීපදෙනෙක් වීල්බරෝ වල දාගෙන බතලයි මඤ්ඤොක්කයි අරං ගෙදරකට යනවා.ඌරා මලිතිව ඒ ගෙදරට එක්කරගෙන ගියා.ඒ ගෙදර ඇතුලෙ තැනිං තැන පුංචි ඌරු පැටවු බතලයි මඤ්ඤොක්කයි බෙදාගන්න පොරකනවා.

තව කාමරේක වයසක ඌරු අත්තලට අත්තම්මලට අල කවනවා.මේව දැකල මලිත්ට හරිම දුකයි.



“ මං ගෙදර යන්න ඕන, අනේ කොහොමහරි මාව එක්ක යන්න”.මලිති ඌරගෙං ඉල්ලුවා.
“ හරි,අපි කොහොම හරි පාර හොයාගමු.මගෙ පස්සෙං එන්න”. ඌරා දුවන්න පටන් ගත්ත.
මලිතිත් පස්සෙං දුවනව.එක පාරටම මලිතිගෙ කකුල පැටලිලා වැටිලා ඔළුව ගලක වැදුනා.මලිතිට ගැස්සිලා ඇහැරුනා.එයා හිටියෙ ගල උඩ හාන්සි වෙලා.කියව කියව හිටපු පොතත් පැත්තකිං වැටිල තිබුන. “ හොඳටම හවස් වෙලා වගේ ” මලිති නැගිටල ගෙදර දිව්වා.ගෙදර යනකොට ගෙදර අය කලබල වෙලා මලිතිව හොයනව.අම්මා මලිතිව තුරුළු කරගත්ත.
“මට කැලේ ගල උඩ නින්ද ගිහිං.දැං ඇහැරුනේ”.මලිති කිව්වා.



පහුවදා මලිති උදේම නැගිටලා වත්ත පිටිපස්සෙ පාත්ති ටික සුද්ද කරා.අතන මෙතන වැටිල තිබුන මඤ්ඤොක්කා කෝටු කෑලි කපල හිටෙවුවා.අත්තා කරනව වගේ ඒව මුලට පස් ගොඩකරා.තිලකා නැන්දලගෙ ගෙදර ගිහිං බතල දඬු ඉල්ලගෙන ඇවිත් හිටවලා වතුරත් දැම්මා.තනියම හිනාවුනා.නගුට වන වන පස්සෙං ආපු කලුවට රහසක් කියල ඔළුවත් අතගෑවා.අම්මලට හරි පුදුමයි මලිතිගෙ මේ වෙනස්වීම ගැන.ඒ වගේම සතුටුයි.



දවසිං දවස මලිතිගෙ වගාව ලස්සනට හැදුනා.
“ ඉක්මනට අල හැදෙයිද අත්තෙ?
තව කොච්චර කල් යයිද අත්තෙ?”
අත්තට කනක් ඇහෙන්න නෑ.මලිතිගෙ ප්‍රශ්ණ වැලයි.
එක දවසක් තාත්තා හවස වැඩ ඇරිල ආවෙ ලොකු දැලක්
ත්‍රීවිලර් එකක පටවගෙන.
“ මං අද දෝණිගෙ වගාව වටේ දාන්න දැලක් ගෙනාවා...
මේවට තමා උෟරු දැල් කියන්නෙ”. තාත්තා මලිතිගෙ
ඔළුව අතගාල කිව්වා.
මලිති කට ඇරං බලාගෙන හිටිය.තාත්තයි අත්තයි එකතු
වෙලා මලිතිගෙ වගාව වටේට කනු හිටවලා දැල හයිකරා.



මලිති බලාහිටියෙ බර කල්පනාවකිං.
එදා රෑට මලිති හරියට කෑමක් කෑවෙත් නෑ.රෑත් වගාව දිහා බලං කල්පනා කරනව අත්තම්ම හොරෙං බලං හිටියා.
පහවදා ඉඳලා මලිතිට වගාව ගැන කිසි උනන්දුවක් නෑ.වෙන දේවල් ගැනත් කිසිම ගානක් නෑ.
“ මේ ළමයට ලෙඩක්ද මන්දා.හරියට කෑමක් කන්නෙත් නෑ.දොස්තර කෙනෙක්ට පෙන්නමුද?”
අම්මා තාත්තගෙං ඇහුවා.


Tom

"ඊයෙ උෟරො ඇවිත්,වැට ළඟ පඟුරු ගාල ගිහිං".දවසක් අත්තා කියනව මලිත්ට ඇහුනා.
මලිති එදා අම්මල අත්තම්මල එහා මෙහා වෙනකං ඉඳල හිමීට ගිහිං උෟරු වැටේ එක තැනක් ගැලෙව්වා.මලිතිට ඒකට ගොඩක් මහන්සි වෙන්න උනත් මූණෙන් නම් මහන්සි බවක් පෙනුනෙ නෑ.
දවස් ගානකිං මලිතිගෙ මූනෙ සතුටක් තියෙනව එදා රෑ ගෙදර අය දැක්ක.හැමෝටම සතුටුයි.මලිතිත් හොඳට කාල මූණත් හෝදගෙන කුස්සිය පැත්තේ එහාට මෙහාට යනවා ,අම්ම හොරෙං බලාගෙන හිටිය.
ටිකකිං කලුවා බුරනව ඇහුන.එතකොටම කුස්සියෙ ජනලෙ ඇරල මලිති හිනාවෙලා මොනවදෝ බලං ඉන්නව දැකපු අම්මත් හිමීට එතෙන්ට ලංවුනා.
"දෙයියනේ..... උෟරෝ...."
අම්මට කෑගැස්සුනා.
මලිති අම්මගෙ කටට අත තද කරා කාටවත් ඇහෙයි කියලා.
" එයාලටත් අපට වගේම බඩගිනි වෙනවනෙ අම්මේ..."
මලිති කිව්වේ ඇස්වල කඳුළු පුරවගෙන.
එතකොටයි අම්මට තේරුනේ මලිතිගෙ වෙනස්වීම් වලට හේතුව.අම්ම මලිතිගෙ ඔළුව අතගෑවා.



මලිති පහුවදා නැගිටලා කුස්සිය පැත්තට එනකොට වගාව වටේ තිබුන දැල කවුදෝ ගලවලා අයිං කරලා.

මලිති පුදුමෙං අම්ම දිහා බලද්දි අම්ම හිනාවෙවී කුස්සියෙ වැඩ.එදා ඉඳං හැමදම රෑට කලුව බිරුවම කුස්සියෙ ජනලෙ ලඟයි දොර ලඟයි හරිම කලබලේ.ගෙදර ඔක්කොම එතන හිරවෙලා බඩගිනිකාරයෝ බඩ පුරවගන්න හැටි බලනවා.



එහෙම බලල නිදාගත්තම රෑ එළිවෙනකං එයාල මලිත්ට

**Thank You**

කියනවා.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-261-5